(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 446.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2015 අප්‍රේල් මස 07 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4794/'14

1\.

ගරු අශෝක් අබේසිංහ මහතා,— බුද්ධ ශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනේ පිහිටුවා ඇති ශාසනාරක්ෂක බලමණ්ඩල සංඛ්‍යාව කොපමණද;

(ii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි ශාසනාරක්ෂක බලමණ්ඩල සංඛ්‍යාව කොපමණද;

(iii) ශාසනාරක්ෂක බලමණ්ඩල ලේකම් ස්වාමීන්වහන්සේලාගේ එම සේවය වෙනුවෙන් යම් වේතන ගෙවීමක් හෝ ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කරන්නේද;

(iv) එම දීමනාව ප්‍රශස්ත සේවයක් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4824/'14

2\.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා යුද හමුදාව විසින් කුලී පදනම මත ලබා ගත්, වායු සමනය කළ, සුඛෝපභෝගී වාහන යුද හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා යොදා ගන්නා බවත්;

(ii) එම වාහන සඳහා ඉන්ධන රජයෙන් ලබා ගන්නා බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කුලී පදනම මත ලබා ගත්, සුඛෝපභෝගී වාහන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පෞද්ගලික පරිහරණය සඳහා යොදා ගැනීමට ශ්‍රී ලංකා යුද හමුදාවේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ එකඟතාවය ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, එම වාහන පරිහරණය පිළිබඳව පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම පරීක්ෂණයේ ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5092/'14

3\.

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය වර්ෂ 5 තුළ දී, ශ්‍රී ලංකා රජය විසින් උගන්ඩා රජය වෙත යම් මූල්‍යමය ආධාර කිරීමක් හෝ ව්‍යාපෘති සඳහා ආධාර කිරීමක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම ආධාරවල මූල්‍ය වටිනාකම කොපමණද;

(iii) එම රට වෙත යම් ඉදිකිරීම් ව්‍යාපෘතියක් ලබා දී තිබේ නම්, එම ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගනු ලැබූ ආකාරය කවරේද;

(iv) එම මූල්‍ය ආධාර හෝ ව්‍යාපෘති ආධාර ලබා දීමේ අරමුණ කවරේද;

(v) ශ්‍රී ලංකා රජය විශාල විදේශ ණය ප්‍රමාණයක් ගෙවීමට තිබිය දී, ඉහත පරිදි වෙනත් රටකට ආධාර ලබා දීම නිශ්ඵල ක්‍රියා මාර්ගයක් නොවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5501/'14

4\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික අධ්‍යාපන විද්‍යා පීඨවලට සිසුන් ඇතුළත් කර ගැනීම පිණිස භාවිතා කරන නිර්ණායකය කවරේද;

(ii) ඒ සඳහා භාවිතා කරන එකම නිර්ණායකය අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ලබා ගන්නා Z අගය නම්, දිස්ත්‍රික් පදනම යටතේ බඳවා ගැනීමේදී, සිසුන් අඩුවෙන් බඳවා ගන්නා දිස්ත්‍රික්කවල සිසුන්ගෙන් ඉතා ඉහළ Z අගයකුත්, වැඩිපුර සිසුන් බඳවා ගන්නා දිස්ත්‍රික්කවල සිසුන්ගෙන් ඉතා පහළ Z අගයකුත් සීමා ලෙස යොදා ගැනීම තුළ, අඩුවෙන් බඳවා ගන්නා දිස්ත්‍රික්කවල සිසුන්ට අසාධාරණයක් සිදුවන බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එම අසාධාරණය ඉවත් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5577/'14

5\.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 සිට 2014 වර්ෂයේ ජූනි මස 30 වැනි දින දක්වා වූ කාල සීමාව තුළ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු අබලි යකඩ අලෙවි කළ අවස්ථා ගණන කොපමණද;

(ii) එක් එක් අවස්ථා තුළදී අලෙවි කළ යකඩ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම යකඩ අලෙවියේදී ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළ වාර ගණන කොපමණද;

(iv) එම එක් එක් අවස්ථාවේදී අලෙවි කළ යකඩ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එමගින් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ලැබූ ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් අවස්ථා අතරින් ටෙන්ඩර් පරිපාටියෙන් තොරව කටයුතු කළ අවස්ථා තිබේද;

(ii) එසේ නම්, එම අවස්ථා ගණන කොපමණද;

(iii) එය සිදු කළ පදනම කවරේද;

(iv) එසේ අලෙවි කළ යකඩ ප්‍රමාණය කොපමණද;

(v) ඒවා කුමන පුද්ගලයන් වෙත අලෙවි කළේද;

(vi) එම එක් එක් පුද්ගලයාට අලෙවි කළ යකඩ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vii) එමගින් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට ලැබුණු ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5774/'14

6\.

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මතුගම ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ, හොරවල උප කාර්යාල සීමාව තුළ හොරවල, දියකිතුලගොඩවත්ත, මතුගම - අළුත්ගම පාරට මුහුණලා පිහිටි අමරපාල ජයනෙත්ති මහතාට අයත් පර්චස් 2.8ක කුඩා ඉඩමේ ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වූ සැලැස්ම අනුමතකර ඇති බවත්;

(ii) එම ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් පසු අවට නිවෙස්වලට ගමන් කරන මාර්ගයට හා අසල ඉදිකර ඇති ගොඩනැගිලිවලට අවහිරතා ඇති වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ගොඩනැගිලි සැලැස්ම අනුමත කිරීම රජයේ නීති රීති අනුව සිදු කර තිබේද;

(ii) නොඑසේ නම්, එම ගොඩනැගිලි සැලැස්මට අනුමතිය ලබා දී ඇති ක්‍රියා පිළිවෙත කවරේද;

(iii) එම අනුමතිය කිනම් පාර්ශ්වයක අවශ්‍යතාවය මත සිදු කර තිබේද;

(iv) රජයේ නීති රීති අනුව නිවසක් හෝ ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ අවසරය ලබා දීම සඳහා තිබිය යුතු අවම බිම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5896/'15

7\.

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ කර්මාන්ත සංවර්ධනයේදී පළාත් පාලන ආයතන මට්ටමින් නව කර්මාන්තපුර ස්ථාපිත කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) නව කර්මාන්තපුරයක් ඉදිකිරීම සඳහා අවිස්සාවේල්ල මැතිවරණ කොට්ඨාසයේ, සීතාවක ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ, සාලාව වත්තේ, කනම්පැල්ල කොටසින් අක්කර 50 ක් නිදහස් කර ගැනීම සඳහා කටයුතු ආරම්භ කර ඇති බවත්;

(ii) එම කර්මාන්තපුරය ස්ථාපිත කිරීම සඳහා එම ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වැදගත් වන බවත්;

(iii) මේ වන විට එම කර්මාන්තපුරය මැදි කොටගත් මාර්ග සංවර්ධනයේ පියවරක් ලෙස ඇස්වත්ත හා රංවල යා කරමින්, කැලණි ගඟ හරහා නව පාලමක් ඉදිකිරීම ආරම්භ කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) ඉහත ආ (i) හි සඳහන් ඉඩම අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් ලබා ඇති ප්‍රගතිය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4801/'14

8.

ගරු අශෝක් අබේසිංහ මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින පුරා සේවය කරනු ලබන පවුල් සෞඛ්‍ය සේවිකාවන්ගේ සමස්ත සංඛ්‍යාව කොපමණද;

(ii) දීප ව්‍යාප්ත සේවය සඳහා අවශ්‍ය පවුල් සෞඛ්‍ය සේවිකාවන් සංඛ්‍යාව කොපමණද;

(iii) හෙද කාර්ය මණ්ඩලයට සූතිකා පුහුණුව ලබාදීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද;

(iv) සූතිකා පුහුණුව ලබාදීමට අදාළව හෙද හා පවුල් සෞඛ්‍ය සේවිකාවන් අතර ඇති වී තිබෙන ගැටලුව විසඳීමට ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4825/'14

9.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වන විට ශ්‍රී ලංකා යුද හමුදාවේ රාජකාරි සඳහා කුලී පදනම මත, වායුසමනය කළ, සුඛෝපභෝගී වාහන ලබා ගෙන තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එසේනම්, ලබා ගෙන ඇති වාහන වර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වායුසමනය කළ වාහනයක් සඳහා ගෙවන මාසික කුලිය එකී වාහන වර්ගය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) සාමාන්‍ය ආරක්ෂක රාජකාරී සඳහා එම වාහන යොදා ගන්නේද;

(ii) නොඑසේ නම්, නිලධාරීන්ගේ ගමන් බිමන් සඳහා එම වාහන යොදා ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) යුද හමුදාව කුලී පදනම මත ලබා ගත්, වායුසමනය කළ, සුඛෝපභෝගී වාහන සඳහා මසකට ගෙවනු ලබන කුලිය කොපමණද;

(ii) 2012 සහ 2013 වර්ෂයන්හි ඉහත වාහන සඳහා ගෙවන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

5578/'14

10.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේදී බොරැල්ල ආයුර්වේද රෝහලෙහි නේවාසික රෝගීන් සඳහා තිබූ ඇඳන් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වන විට එම රෝහලෙහි නේවාසික රෝගීන් සඳහා ඇති ඇඳන් සංඛ්‍යාව කොපමණද;

(iii) 2006 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ එම රෝහලේ තිබූ ඇඳන් සංඛ්‍යාව අඩු වී තිබේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නාගරික සංවර්ධන අධිකාරිය විසින් වර්ෂ 2020ට අදාළව සකසා ඇති කොළඹ නාගරික සැලැස්ම තුළ බොරැල්ල ආයුර්වේද රෝහල අන්තර්ගත වී තිබේද;

(ii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4802/'14

11.

ගරු අශෝක් අබේසිංහ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2013 දක්වා වූ කාල සීමාවේදී ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය කොපමණද;

(ii) දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනයට සාපේක්ෂව සේවා නියුක්තිය වර්ධනය වී තිබේද;

(iii) සේවා නියුක්ති ප්‍රතිශතය ගණනය කරන ක්‍රමවේදය කවරේද;

(iv) සේවා නියුක්තිකයෙක් ලෙස අර්ථ කථනය කිරීමේදී යොදා ගන්නා වයස් සීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4826/'14

12.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වන විට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ රාජකාරි සඳහා කුලී පදනම මත වායුසමනය කළ, සුඛෝපභෝගී වාහන ලබා ගෙන තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ලබා ගෙන ඇති එම වාහන වර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වායුසමනය කළ වාහනයක් සඳහා ගෙවන මාසික කුලිය එකී වාහන වර්ග අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) සාමාන්‍ය ආරක්ෂක රාජකාරී සඳහා එම වාහන යොදා ගන්නේද;

(ii) නොඑසේ නම්, නිලධාරීන්ගේ ගමන් බිමන් සඳහා එම වාහන යොදා ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ශ්‍රී ලංකා ගුවන් හමුදාව කුලී පදනම මත ලබා ගත්, වායුසමනය කළ, සුඛෝපභෝගී වාහන සඳහා මසකට ගෙවනු ලබන කුලිය;

(ii) 2012 සහ 2013 වර්ෂයන්හි ඉහත වාහන සඳහා ගෙවන ලද මුදල වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

5579/’14

13.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වන විට සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් පාලනය වන ආයුර්වේද රෝහල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් රෝහල්වල නම් කවරේද;

(ii) එම රෝහල් පිහිටා ඇති ස්ථාන කවරේද;

(iii) 2013 වර්ෂය තුළදී ඉහත එක් එක් රෝහල වෙතින් ප්‍රතිකාර ලබා ගෙන ඇති බාහිර රෝගීන් සංඛ්‍යාව සහ නේවාසික රෝගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

මුදල් අමාත්‍යතුමා,— දේශීය ආදායම් (සංශෝධන),— 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

2.

මුදල් අමාත්‍යතුමා,— එකතු කළ අගය මත බදු (සංශෝධන),— 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

3.

මුදල් අමාත්‍යතුමා,— ජාතිය ගොඩනැගීමේ බදු පනත (සංශෝධන),— 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

4.

මුදල් අමාත්‍යතුමා,— මුදල්,— මත්පැන් අලෙවිහල් සහ තැබෑරුම් අය බද්ද, කැසිනෝ කර්මාන්ත අය බද්ද, සුපිරි වාසි බද්ද, ජංගම දුරකථන ක්‍රියාකරු අය බද්ද, නිවාස සඳහා සෘජු චන්ද්‍රිකා සේවා අය බද්ද, චන්ද්‍රිකා ස්ථාන අය බද්ද, ක්‍රීඩා සඳහා වෙන් වූ නාලිකා අය බද්ද, මන්දිර බද්ද, විගමන බද්ද සහ මෝටර් වාහන ආනයනකරුවන්ගේ බලපත්‍ර ගාස්තුව පැනවීම සඳහා විධිවිධාන සැලස්වීම පිණිස ද, ඊට සම්බන්ධ හා ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

5.

මුදල් අමාත්‍යතුමා,— ආර්ථික සේවා ගාස්තු (සංශෝධන),— 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

6.

මුදල් අමාත්‍යතුමා,— විදුලි සංදේශ බදු (සංශෝධන),— 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

7.

මුදල් අමාත්‍යතුමා,— ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන),— 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

8.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

මුදල් අමාත්‍යතුමා,—දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ යෝජනාව,— මෙයට පෙර යෝජනාව මඟින් අවසර දෙන ලද මුදලට වැඩිමනත් වශයෙන් රු.400,000,000,000කට නොවැඩි මුදලක් ශ්‍රී ලංකාවේදී ශ්‍රී ලංකා ආණ්ඩුවේ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමෙන් ණයට ගැනීමටත්, එම කාර්යය සඳහා (417 වැනි අධිකාරය වන) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ 2(1) වැනි වගන්තියට යටත්ව අවශ්‍ය සියලුම අවසර මුදල් අමාත්‍යතුමාට දීමටත්, මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

ඉඩම් අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග (අංක 1),— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

ඉඩම් අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග (අංක 2),—1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 31 දිනැති අංක 1886/58 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.03.17 දින ඉදිරිපත් කළ නියෝග අනුමත කළ යුතු ය.

*4.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද, නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද, නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද, නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.12.12 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියෝග,— ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නිර්දේශ මත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වැනි වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරිය විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 10 දිනැති අංක 1883/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.24 දින ඉදිරිපත් කරන ලද නියෝගය (විදුලිබල පරීක්ෂකවරුන්ගේ කාර්යය, කර්තව්‍ය හා කාර්යපටිපාටි) අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවි අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*11.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2014 අගෝස්තු 07) [1].

*12.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

13.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

14.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

15.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

16.

මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

17.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

18.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

19.

ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

20.

චම්පික ප්‍රේමදාස ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

**[1]**
"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.